ශීර්ෂය 119 - බලශක්ති අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 119 - බලශක්ති අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බලශක්ති අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජුනි 09 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 23 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, බලශක්ති අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව බලශක්ති අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව බලශක්ති අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය **කරනු** නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන

පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ලිහිසිතෙල් කර්මාන්තය සඳහා 2023 අප්‍රේල් 25 දිනැති අමප/23/0632/621/031 අංක දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, වාර්ෂික ස්ථාවර ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු. 6,000,000 ක මුදලක්ද, ඊට අමතරව වාර්ෂික විකුණුම් පරිමාව පාදක කරගනිමින් එම වටිනාකමින් සියයට 0.9ක මුදලින්, වාර්ෂික ස්ථාවර ලියාපදිංචි ගාස්තුව අඩුකොට ඉතිරි මුදල විචල්‍ය ලියාපදිංචි ගාස්තුව ලෙස අයකළ යුතුය. අමාත්‍යාංශය, එක් එක් බලපත්‍රලාභියා සමඟ ඇතිකරගත් ගිවිසුම්වල 3.5 වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභී ආයතන විසින් ආනයන සහ විකුණුම් වලට අදාල මාසික තොරතුරු අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි මාසිකව සහ අර්ධ වාර්ෂික තොරතුරු අර්ධ වර්ෂය අවසන් වී දින 14ක් ඇතුළත සහ වාර්ෂික විගණනය කළ තොරතුරු මාස 06ක් ඉක්මවීමට පෙර අමාත්‍යාංශයට සහ මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. 2024 වර්ෂය තුළ වාර්ෂික බලපත්‍ර ලබාගත් ආයතන 13ක් පමණක් ස්වතක්සේරුව මත විචල්‍ය ලියාපදිංචි ගාස්තු ගෙවා තිබුණි. අමාත්‍යාංශය විසින් ගිවිසුම් ප්‍රකාරව අදාල තොරතුරු බලපත්‍රලාභීන්ගෙන් ලබාගෙන පරීක්ෂා කර 2023 හා 2024 වර්ෂ සඳහා විචල්‍ය ලියාපදිංචි ගාස්තු නිවැරදිව ගණනය කර, අයකර ගැනීමට හෝ හිඟ විචල්‍ය ලියාපදිංචි ආදායම, හිඟ ආදායම් ප්‍රකාශයට හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් හිඟ ආදායම නිවැරදිව සන්නිරීක්ෂණය කළ නොහැකි විය. මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයට අදාලව ප්‍රසිද්ධ කරන ලද ලිහිසිතෙල් වෙළඳපොළ තොරතුරු පදනම් කරගනිමින් 2023 හා 2024 වර්ෂ සඳහා විගණනය විසින් ගණනය කරන ලද හිඟ ලිහිසි තෙල් විචල්‍ය ලියාපදිංචි ගාස්තු රු. මිලියන 231 ක් විය.	2022 වර්ෂය වනතුරුම අදාල විචල්‍ය ලියාපදිංචි ගාස්තුව අයකරනු ලැබුවේ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසිනි. නමුත් 2023.04.23 දිනැති අමප/23/0632/621/031 අංක දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාල ගාස්තු ද්විත්වයම මෙම අමාත්‍යාංශය මඟින් අයකර ගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව 2024 වර්ෂය වන විට ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් ලිහිසිතෙල් තර්මාන්තයට අදාළ අලෙවි තොරතුරු යාවත්කාලීන කිරීම නවතා දමන ලදී. ඒ අනුව මෙම අමාත්‍යාංශය විසින් ලබාගෙන ඇති තොරතුරු අනුව අදාල විචල්‍ය ගාස්තු අයකිරීම සිදුකරගෙන ගිය අතර මේ වන විට මෙම අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් අදාල කටයුතු 2023 හා 2024 වර්ෂයද ඇතුලත්ව ඉදිරියට නිවැරැදිව පවත්වාගෙන යාම සඳහා එකඟතාවයට පැමිණ ඇත. ඒ අනුව නුදුරේදීම අදාල ඡායා නියාමනයට අදාල කටයුතු සිදුකරගෙන යාම සඳහා මෙම අමාත්‍යාංශය විසින් මුදල් ලබාදීම වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට අපේක්ෂා කරනු ලබයි.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රජයේ ආදායම රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ) **දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අමාත්‍යාංශයට සියයට 60ක හිමිකාරිත්වයක් සහිත සීමා සහිත පොලිප්ටෝ සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2018 සැප්තැම්බර් 26 දින මෙහෙයුම් හා නඩත්තු කටයුතු ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ගිවිසුම අනුව නිමවුම්කරු විසින් අමාත්‍යාංශයට වසර 10කින් බේරුම් කළ යුතු ප්‍රතිෂ්ඨාව වූ රු. 82,019,500ක වටිනාකම මේ දක්වා මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. අමාත්‍යාංශයට ලැබිය යුතු ප්‍රතිෂ්ඨාව ගණනය කිරීමේදී රු. මිලියන 1.25කට තක්සේරු කරන ලද මෝටර් වාහනය ඇතුළත් කර නොතිබුණි.	පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම සතුව තිබූ Toyota Crew Cab 51-7303 දරණ වාහනයේ තක්සේරුව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ඉටු කළ නොහැකි බව මෙම අමාත්‍යාංශය වෙත දැනුම් දුන් අතර ඒ වන විට අනෙකුත් තක්සේරු වටිනාකම් වන රුපියල් 82,019,500.00 KL/LM තක්සේරු වාර්තාව මඟින් ලබාගෙන අදාළ මෙහෙයුම් හා නඩත්තු ගිවිසුම සකස් කර තිබුණි. පසුව ලංකා ඔටෝ මොබයිල් සමාගම වෙතින් එම වාහනයට අදාළ වටිනාකම තක්සේරු කර ගන්නා ලදී. එම තක්සේරු වටිනාකම මිලියන 1.25 ක් විය. එම මිලියන 1.25 ක මුදල ගිවිසුමේ සඳහන් නොවූව ද රජයේ වත්කමක් වශයෙන් එම සමාගම සතුව පවතින බව සඳහන් කරමි. ඒ අනුව එම සම්පූර්ණ තක්සේරු වටිනාකම රු.මිලියන 83.269 කි. මේ පිළිබඳව ඉදිරි මූල්‍ය ප්‍රකාශන වෙත ඇතුළත් කිරීමට බලාපොරොත්තු වෙමි.	අමාත්‍යභාංශය වෙත ලැබිය යුතු වටිනාකම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගුවන් යානා ඉන්ධන ආනයන, අපනයනය, විකිණීම සහ බෙදාහැරීම සඳහා 2024 වර්ෂයට අදාළව ආයතන දෙකක් විසින් බලපත්‍ර 03ක් අලුත්කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂය සඳහා ඇ.ඩො. 30,000 ක් ලෙස ඇස්තමේන්තු කළ යුතු ආදායම ඇ.ඩො. 20,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි.	ගුවන්යානා ඉන්ධන (JET A -1) ආනයන අපනයන විකිණීම හා බෙදා හැරීම සඳහා 2024 වර්ෂය සඳහා Cannel හා Fits oil ආයතන දෙක ලියාපදිංචි වී ඇති අතර මෙයින් Cannel ආයතනය ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉඩම් තුළ ගබඩා ටැංකි හා නළ එලීම සඳහා තවත් බලපත්‍රයක් පසුව ලබා ගෙන ඇත. මෙම ආයතනය මඟින් ගබඩා ටැංකි හා නළ එලීම සඳහා කිසිඳු මෙහෙයුම් කටයුත්තක් මේ වනතුරු ද ආරම්භ කර නොමැති අතර බලපත්‍ර අළුත් කිරීමක් ද සිදු කර නොමැත. මේ නිසා 2024 වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී උක්ත ආයතන දෙක ගුවන්යානා ඉන්ධන ගෙන්වීමට පමණක් අයවිය යුතු මුදල (ඒක් ආයතනයකින් ඇ.ඩො. 10,000 බැගින්) ඇ.ඩො. 20,000 පමණක් ඇතුළත් කරන ලදී.	පවතින යාවත්කාලීන තොරතුරු මත පදනම්ව ඇස්තමේන්තු සකස්කළ යුතුය.
(ආ)	2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ 1(i))ට අනුව හිඟ ආදායම් ලෙස හඳුනාගත් ලංකා ඛණිජතෙල් සංස්ථාව වෙතින් 2022 සහ 2023 වර්ෂයන්ට අදාලව අයවිය යුතු තාර වෙළඳාම සඳහා වාර්ෂික ලියාපදිංචි ගාස්තු රු. 4,400,000ක් සහ 2024 වර්ෂයට අදාලව පෞද්ගලික සමාගමකින් අයවිය යුතු ලිහිසි තෙල් බලපත්‍ර ගාස්තු රු. 2,989,020ක් අයකරගෙන නොතිබුණි.	2022 හා 2023 වර්ෂයන්ට අදාළව ලංකා ඛනිජතෙල් සංස්ථා මඟින් අයවිය යුතු තාර වෙළඳාම සඳහා හිඟ ලියාපදිංචි ගාස්තු ගෙවන ලෙස එම ආයතනය දැනුවත් කරමින් ලිපි යවා ඇත.මෙහිදී ලංකා ඛනිජතෙල් සංස්ථාව තාර වෙළඳාම සඳහා ලියාපදිංචි ආයතනයක් වුවද ඛනිජතෙල් සංස්ථා පනත අනුව තාර වෙළඳාමෙහි නිරතවීම සඳහා බලපත්‍ර ගාස්තු ගෙවීම අනිවාර්යය නැත. කෙසේ නමුත් ලංකා ඛනිජතෙල් සංස්ථාව වෙත තාර වෙළඳාම සඳහා හිඟ බලපත්‍ර ගාස්තුව ගෙවීම සඳහා අවස්ථා කිහිපයකදී ලිපි මඟින් දැනුවත් කර ඇත.	නිසි පරිදි කාලීනව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

		ENOC Marketing LLC සමාගමෙන් අයවිය යුතු ලිහිසිතෙල් බලපත්‍ර ගාස්තුව රු. 2,989,020 ක මුදල එම සමාගම ගෙවීමට අපොහොසත් වුවහොත් එම ආයතනයේ බලපත්‍රය අහෝසි කරන බව ආයතනය දැනුවත් කරමින් 2025.04.28 දින ලිපි මඟින් දැනුවත් කර ඇත.ENOC Marketing LLC ආයතනය 2022 වර්ෂයේ සිට ලිහිසිතෙල් සඳහා ලියාපදිංචි වී ඇති අතර ලියාපදිංචි ගාස්තු 2022 වර්ෂයේ සිට 2024 වර්ෂයේ පළමු අර්ධ වර්ෂය දක්වා ගෙවා ඇති අතර ව්‍යාපාර කටයුතුවල මේ වනතෙක් නියැලී නැත.	

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ව්‍යාපෘති 05ක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 05ක් සඳහා වෙන් කළ රු. මිලියන 3,406ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමකින් තොරව ඉතිරිවී තිබුණි.	කුඩා දූපත්වල දෙමුහුම් පුනර්ජනනීය බලශක්ති පද්ධතිය ඉදිකිරීම - ව්‍යාපෘතිය බඳු වලින් නිදහස් වූ බැවින් ශුද්ධ ප්‍රතිපාදනය උපයෝජනය කිරීමකින් තොරව ඉතිරි වී ඇත. මෙම ව්‍යාපෘතිය පිළිබඳ තීරණ ගැනීමට සහ මෙම ඉන්දියානු ප්‍රදාන ව්‍යාපෘතිය සඳහා අරමුදල් නිදහස් කිරීමට ඉන්දීය තානාපති කාර්යාලය ඒකාබද්ධ ව්‍යාපෘති අධීක්ෂණ කමිටුවක් (JPMC) පිහිටුවා ඇත. බලශක්ති මෙවලම් නාමකරණය කිරීමේ වැඩ සටහන් සඳහා වායුසමීකරණ රසායනාගාර ඉදිකිරීම - මෙම ව්‍යාපෘතිය බදුවලින් නිදහස් වූ බැවින් ප්‍රතිපාදන ඉතිරි විය. බලශක්ති අංශයේ ප්‍රධාන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ධාරිතා සංවර්ධන වැඩ සටහන - මූල්‍ය ප්‍රදාන සිදු කළ JICA ආයතනය විසින් වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබූ අතර ගිණුම්ගත කිරීම සඳහා අමාත්‍යාංශය වෙත වියදම් වාර්තා ලබා දී නොමැත.	වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව තුළ වියදම් දරමින් ව්‍යාපෘති නියමිත කාල රාමුව තුළ ක්‍රියාත්මක කළ යුතුය.

		කොරියානු රජයේ ප්‍රධාන යටතේ ඉදිවන බැටරි බලශක්ති ගබඩා පද්ධතිය - ව්‍යාපෘති දෙකක සැලසුම් සඳහා එකඟතාවය ලබා දීම ප්‍රමාද වී ඇති අතර යන්ත්‍රෝපකරණ ආනයනය 2025 වර්ෂය දක්වා දීර්ඝ කරන ලදි.	
(ආ)	අංක 119-2-3-36-13-2202 දරණ වැය විෂය යටතේ සංවර්ධන සහයන් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබූ අතර පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රු. 300,000,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එම ප්‍රතිපාදිත මුදලින් රු. 59,697,576ක් වියදම් කර තිබූ අතර රු. 240,302,424 ක් එනම් සියයට 80ක් ඉතිරිවී තිබුණි.	මෙම උපදේශක ගාස්තු කොටස් 03 ක් වශයෙන් ගෙවීමට සැලසුම් කර තිබූ අතර එහි පළමු 20% ගෙවා ඇත. ඉතිරි වාරික දෙක 60% සහ 20% ලෙස ගෙවීම් සිදු කළ යුතු අතර එම ගෙවීම සඳහා නිර්දේශ කර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතන වන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් අදාළ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඉන්දියානු රජය මඟින් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. ඉන්දියානු රජය මඟින් ව්‍යාපෘතියට අදාළ සම්පූර්ණ ව්‍යාපෘති තොරතුරු වර්තාවට (Detail Project Report) අනුමැතිය ලබා නොදීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය.	ව්‍යාපෘතින්වල ප්‍රගතිය එකඟ වූ නිමැවුම් මට්ටම් අනුව කාලීනව ඇගයීම් කර නිමැවුම අනුව කාලීනව ගෙවීම් කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මන්නාරම් ද්‍රෝණියේ ඛණිජතෙල් ගවේෂණ කටයුතු මන්නාරම් ද්‍රෝණියේ එම් - 2(M-2) ගවේෂණ බිම් කොටසේ (SL 2007-01-001) ඛනිජතෙල් ගවේෂණ කටයුතු සඳහා පෞද්ගලික සමාගමක් 2007 වර්ෂයේදී තෝරාගෙන තිබූ අතර 2011 වර්ෂයේදී එම සමාගම විසින් ස්වාභාවික වායු නිධි දෙකක් සොයාගෙන තිබුණි. 2016 සැප්තැම්බර් 06 දිනැති අංක 16/1745/746/021 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව මන්නාරම් ද්‍රෝණියේ එම් - 2(M-2) ගවේෂණ බිම් කොටසෙන් සොයාගත් ස්වාභාවික වායු නිධි සංවර්ධනය හා නිෂ්පාදන කටයුතු	2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අධ්‍යක්ෂ ජනරාල් ධුරය හෙබවූ සහ 2011 වර්ෂයේදී ඛනිජතෙල් ගවේෂණ හා කැණීම් මෙහෙයුම් සිදුකළ කෙයාන් ලංකා සමාගම මෙරටට ගෙන්වා ගැනීමට මූලික වී ක්‍රියා කළ ආචාර්ය නීල් ද සිල්වා මහතා නැවතත් 2024.12.18 දින සිට ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරියේ	අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ඉදිරි කටයුතු සිදුකළ යුතු අතර මේ පිළිබඳව නැවත සමාලෝචනයක් සිදු කිරීම වැදගත් වේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	සඳහා සුදුසු ආයෝජකයෙකු අන්තර්ජාතික තරඟකාරී යෝජනා කැඳවීමේ ක්‍රියාවලියක් මඟින් තෝරා ගැනීමට අවශ්‍ය තාක්ෂණික හා අලෙවිකරණ උපදේශන සහය ලබාගැනීම සඳහා විදේශීය සමාගමක් 2016 දෙසැම්බර් 14 වන දින පත් කරගෙන තිබුණි. උපදේශන සහය ලබා ගැනීමේ ගිවිසුම 2017 දෙසැම්බර් 13 දින අවසන්ව තිබූ අතර එම කාර්ය සඳහා අමාත්‍යාංශය විසින් ඇ.ඩො. 300,000 ක් එනම් එවකට පැවති විනිමය අනුපාත අනුව රු. 46,610,853ක වියදමක් දරා තිබුණි. ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් සම්පත් ගවේෂණය, සංවර්ධනය, උකහා ගැනීම සහ කළමණාකරණය යන කාර්යයන් නියාමනය කිරීමේ පරමාර්ථ ඇතිව 2021 අංක 21 දරණ ඛනිජතෙල් සම්පත් පනතේ විධිවිධාන යටතේ 2021 ඔක්තෝබර් 08 වන දින ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය ස්ථාපිත කර තිබූ අතර එමඟින් ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම් හා ඛනිජතෙල් සම්පත් සේවා සපයන්නන්ගේ බලපත්‍ර වලට අදාල රෙගුලාසි හා ශ්‍රී ලංකා ඛනිජතෙල් සම්පත් ගවේෂණ සහ සංවර්ධන බිම් කොටස් සිතියම ප්‍රකාශයට පත් කර තිබුණද, අදාල අධ්‍යයනයන් සඳහා සුදුසු ආයෝජකයෙකු සොයාගැනීමට විගණිත දින දක්වා නොහැකි වී තිබුණි.	අධ්‍යක්ෂ ජනරාල් ධූරයට පත් කර ඇත. මේ වන විට එතුමාගේ මඟ පෙන්වීම යටතේ නව උපායමාර්ගික වැඩපිළිවෙලක් ලෙස මන්නාරම් ද්‍රෝණියේ ගවේෂණ බිම් කොටස් 4 ක් සඳහා බලපත්‍ර වටයක් පවත්වා ඛනිජතෙල් හා ස්වාභාවික වායු ගවේෂණ හා නිෂ්පාදන කාර්යය සඳහා ආයෝජන යෝජනා කැඳවීමට සැලසුම් කර ඇත. ජාතික වැදගත්කමක් ඇති මෙම කාර්යය වෙනුවෙන් 2025.05.07 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී කැබිනට් අනුමැතිය හිමිවූ අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරගෙන යයි.	

4.2 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විදේශාධාර ව්‍යාපෘති යටතේ රු. මිලියන 47,658ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති 15ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර ඉන් ව්‍යාපෘති 07ක ප්‍රවර්ථන වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය සියයට 51කට වඩා අඩු මට්ටමක පවතින බව ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය.	ව්‍යාපෘති 07ට අදාලව ප්‍රමාදයන් සිදුවී ඇත.	නියමිත කාල වකවානුව තුළදී ව්‍යාපෘති අවසන් කර අපේක්ෂිත ඉලක්ක ළඟාකරගත යුතුවේ.

4.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අමාත්‍යාංශය විසින් 2024 දෙසැම්බර් 31 දිනට පරීක්ෂණ අවසන් කරන ලද වාහන අනතුරු 04ක් සම්බන්ධයෙන් මු.රෙ. 104(4) ප්‍රකාරව රු. 2,676,191ක අලාභ හානි අයකරගෙන නොතිබුණි.	**PH-2913** වාහනයට අදාළ අනතුර සම්බන්ධයෙන් අලාභය රක්ෂණ සමාගම විසින් ආවරණය කිරීමට කටයුතු කරන බවට විසින් දන්වා ඇත. PC-4318 වාහනේ අනතුර සම්බන්ධයෙන්, රක්ෂණාවරණය ලබා ගෙන වන්දි ලබා ගැනීම සඳහා අදාළ විස්තර රක්ෂණ ආයතනය වෙත යොමු කර ඇත. HE-2381 වාහනේ අනතුර සම්බන්ධයෙන් අලාභය අයකර ගැනීම සඳහා අනතුරට වගකිව යුතු වූ 59-8950 රථයේ රියදුරුට විරුද්ධව නඩු පැවරීමට කටයුතු කරන බවට ලංවිම නීති නිලධාරි විසින් අමාත්‍යාංශය වෙත දන්වා ඇත. CAF 5016 වාහන අනතුර සම්බන්ධයෙන් ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.	අලාභයන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4.4 කළමනාකරණ දූර්වලතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සීමාසහිත පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම ඉවතලන ප්ලාස්ටික්/පොලිතීන් මඟින් ඉන්ධන නිපදවීම සඳහා 2009 වර්ෂයේ අමාත්‍යාංශයට සියයට 60ක කොටස් අයිතියක් සහිතව සීමාසහිත පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම ආරම්භකර තිබුණි. 2018 වර්ෂයේ සමාගම ප්‍රතිව්‍යුහගත කර අමාත්‍යාංශය හා නිමවුම්කරු අතර 2018	ඉවතලන ප්ලාස්ටික් මඟින් ඉන්ධන නිපදවීම සඳහා සී/ස පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම 2009 වර්ෂයේ දී පරිසර හා ස්වභාවික සම්පත් පිලිබඳ විෂය භාර අමාත්‍යාංශය යටතේ ආරම්භ කර 2011 වර්ෂයේ දී ඛනිජ තෙල් සම්පත් සංවර්ධන විෂයභාර අමාත්‍යාංශය යටතට පත් කරන ලදී. 2018 වර්ෂය දක්වා මෙම සමාගමේ නිෂ්පාදන හා පරිපාලන කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් වාර්ෂිකව	ගිවිසුම ප්‍රකාරව නැවත පියවා ගැනීමට කටයුතු කළ යුතුය.

සැප්තැම්බර් 26 දින මෙහෙයුම් හා නඩත්තු ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ගිවිසුමේ 09 වන වගන්තිය අනුව, ප්‍රතිව්‍යුහගත කරන අවස්ථාවේ දී සමාගමේ ස්ථාවර වත්කම්වල තක්සේරු වටිනාකම වූ රු. 82,019,500 කට තක්සේරුකර තිබුණි. ගිවිසුමේ 12 වන වගන්තිය ප්‍රකාරව, තක්සේරු මුදල වූ රු. 82,019,500ක සම්පූර්ණ මුදල හා ඊට අදාල පොලියද සමඟ අමාත්‍යාංශය වෙත ගෙවා අවසන් වනතුරු සමාගෙමේ කොටස් අයිතියෙන් සියයට 1ක් අමාත්‍යාංශය සතුවිය යුතු බව දක්වා තිබුණද, ඊට පටහැනිව 2018 ඔක්තෝබර් 03 දින අමාත්‍යාංශය සතු සමාගමේ සියළුම කොටස් නිමවුම්කරු වෙත පවරා තිබුණි. සමාගම ආරම්භයේ සිට ප්‍රතිව්‍යුහගත කරන ලද අවස්ථාව දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රජය විසින් මූලික ප්‍රාග්ධනයද ඇතුළුව, රු. මිලියන 300කට අධික වියදමක් මෙම සමාගම සඳහා දරා තිබුණි. ජාතික වශයෙන් ඉතා වැදගත් අරමුණු රැසක් ඉටුකර ගැනීම පෙරදැරි කරගනිමින් නියමු ව්‍යාපෘතියක් ලෙස ස්ථාපිත කරන ලද මෙම සමාගමේ මෙහෙයුම් අර්ධ වානිජ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමේදී, නිසි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදුනොකිරීම, නිෂ්පාදන වෙළඳපොළ අවස්ථා හඳුනා නොගැනීම, ඇතුළුව මෙහෙයුම් සැලසුම්කරණය හා කළමණාකරණයේ දූර්වලතා හේතුවෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට හෝ රජය යෙදවූ මුදලට කිසිදු ප්‍රතිලාභයක් ලබා ගැනීමට නොහැකිවී තිබුණි.

වෙන් කරන ලදී. අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 2018 වර්ෂයේ දී මෙම සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරන ලදී.

මෙහිදී එහි නිමැවුම්කරු වෙත අයත්ව තිබූ සමාගමේ කොටස් 30 ට අමතරව රජය සතුව තිබූ කොටස් 60 ද මොරටුව විශ්ව විද්‍යාලය සතුව තිබූ කොටස් 10 ද වශයෙන් සම්පූර්ණ කොටස් ප්‍රමාණය එම සමාගම වෙත පවරා දෙන ලදී.

අදාළ මෙහෙයුම් හා නඩත්තු ගිවිසුමට අනුව ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව සමාගමට අයත් අදාළ යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු සිදු කිරීමේ වගකීම එම සමාගම සතු විය.

එහෙත් වසර 4 ක පමණ කාලයක් තුළ එම සමාගමේ නිෂ්පාදන කටයුතු සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීම ප්‍රමාද වී තිබූ අතර 2022 වර්ෂයේ දී පරිසර ආරක්ෂණ බලපත්‍රය පොලිප්ටෝ සමාගම වෙත ලබා දී ඇත.

කෙසේවුවද මෙම අමාත්‍යාංශය සමඟ පැවති සාකච්ඡාවලදී පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගමේ කළමනාකාරිත්වය සඳහන් කරන ලද්දේ ප්ලාස්ටික් අමුද්‍රව්‍ය පමණක් භාවිතා කිරීමෙන් ඉන්ධන නිෂ්පාදනය අලාභ සහිත වන බැවින් ඉවතලන අපද්‍රව්‍ය තෙල් ද යොදා ගනිමින් මෙම ඉන්ධන නිෂ්පාදන කටයුතු සිදු කළ යුතුව ඇති බවයි.

කෙසේ වුවද මෙම සමාගමේ ස්ථාවර වත්කම් තක්සේරු මුදල වන රු. 83,269,500 ක මුදල එම සමාගමේ වත්කම් වශයෙන් පවතින අතර එම මුදල නැවත පියවීම සඳහා 2018 වර්ෂයේ සිට වසර 10 ක සහන කාලයක් එම සමාගම වෙත ලබා දී ඇත.

පවතින සහන කාලය තුළ මෙම ව්‍යාපෘතියේ කටයුතු තවදුරටත් විධිමත් කරමින් සාර්ථක බවට පත්කරලීම

		සඳහා එම සමාගම විසින් කටයුතු කළයුතු බවට අමාත්‍යාංශය මඟින් උපදෙස් ලබා දී ඇත.	
(ආ)	2024 වර්ෂයේ සැලසුම්කර ඇති ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො. 11,900,000 වන කොරියානු රජයේ ආධාර යටතේ ඉදිකිරීමට නියමිත හම්බන්තොට බැටරි බලශක්ති ගබඩා පද්ධති ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේදී රු. 3,239,000,000ක භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන්කර තිබුණද, අදාල ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.	2024 වර්ෂයේ ව්‍යාපෘතියේ සැලසුම අනුමත නොවූ හෙයින් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.	අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සම්බන්ධව නිසි අධීක්ෂණයක් සිදුකොට එම ව්‍යාපෘති කඩිනමින් ඉටු කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම		
	I. ජාතික මෙහෙයුම් කමිටුවක් මඟින් බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළ යුතු අතර අදාළ කමිටුව කාර්තුමය පරාසයන් තුළ රැස්වී ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලයට වාර්තා කිරීම කළ යුතු වුවද 2024 වර්ෂය තුළ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	ජාතික මෙහෙයුම් කමිටුව 2024 වර්ෂයේදී බලගන්වා නොමැත. ඊට ප්‍රධාන හේතුව වූයේ අමාත්‍යාංශ ලේකම් කිහිපදෙනෙකු හා ආයතන ප්‍රධානීන් කිහිපදෙනෙකු පමණක් සිටින බැවින් එම කාර්ය සිදු කිරීම ප්‍රායෝගික නොවන බැවිනි.	බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කාලීනව අධීක්ෂණය කර අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කල යුතුය.
	II. බලශක්ති ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි 04 වන ඡේදය ප්‍රකාරව, කාර්යසාධන කාලරාමුව සෑම වසර දෙකකට වරක්ම එම වගකීම පවරා ඇති ආයතන විසින් සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. නමුත් 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වසර 05ක් ගතව ඇතත් අදාළ කාර්යසාධන කාලරාමුව අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට එකී ආයතන විසින් කටයුතු කර නොතිබුණු අතර	ජාතික බලශක්ති ප්‍රතිපත්තියට අනුව කාලරාමුව සෑම වසර දෙකකටම වරක් සංශෝධනය විය යුතු වුවත් , 2024 දී එසේ සිදුවී නොමැත. එහෙත් 2024 වර්ෂයේ දී මෙම ප්‍රතිපත්තිය සමාලෝචනය කර නිර්දේශ ලබා දීම සඳහා සමාලෝචන කමිටුවක් පත් කර ඇත.	බලශක්ති කාර්යසාධන කාලරාමුව කාලීනව අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සංශෝධනය කළ යුතුය.

	අමාත්‍යාංශය විසින් එම කටයුතු අධීක්ෂණය කර නොතිබුණි.		
III.	කාර්යසාධන කාලරාමුවේ බලශක්ති ක්ෂේත්‍රයේ යහපාලනය ශක්තිමත් කිරීම යටතේ 4.8.g ඡේදය තරඟකාරී පදනම මත ආයෝජකයන්ට සහ සංවර්ධන හවුල්කරුවන්ට පහසුවෙන් සහභාගීවීම සඳහා බලශක්ති ක්ෂේත්‍රයේ සියළු ව්‍යාපෘති සහ ආයෝජන අවස්ථාවන් හඳුනාගෙන යම් සුදුසු ව්‍යාපෘති සංකල්ප ආකෘතියක ලේඛණ ගතකර එක් එක් ආයතන විසින් 2020 වර්ෂයේ සිට ප්‍රකාශයට පත් කළ යුතුය. සුනිත්‍ය බලශක්ති අධිකාරිය පමණක් රටේ පවතින සියළු පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් පවතින ස්ථාන ගැසට් පත්‍රයක් මඟින් ප්‍රසිද්ධකොට තිබුණි. නමුත් ඉහත ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් එම කටයුතු අධීක්ෂණය කළ බවට විගණනයට තොරතුරු ඉදිරිපත් නොකරන ලදී.	විදුලිබල මණ්ඩලය විසින් හඳුනාගන්නා ව්‍යාපෘති ආයෝජන සඳහා පෞද්ගලික අංශයෙන් යෝජනා කැඳවීමේ දී ඒ සඳහා Request for Proposals (RFP) ආකෘතියක් සකස් කර ඇත.	බලශක්ති ක්ෂේත්‍රයේ පවතින ව්‍යාපෘති සහ ආයෝජන අවස්ථාවන් හඳුනාගෙන ප්‍රසිද්ධ කිරීම.
IV.	කාර්යසාධන කාලරාමුවේ 4.9.e ඡේදය අනුව පොදු සේවා සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් මාර්ග පිළිබඳ ගැටළු විසඳීම සඳහා අන්තර් ආයතන සම්බන්ධීකරන අධිකාරිය 2020 වසර වන විට පිහිටුවීමට නියමිතව තිබුණද, 2024 වර්ෂය අවසානය වන විටත් එය ක්‍රියාත්මක කර ඇති බවට විගණනයට තොරතුරු ඉදිරිපත් නොවුණි.	ගැටුම් නිරාකරණය කිරීම සඳහා අන්තර් ආයතනික උපයෝගිතා කොරිඩෝ සම්බන්ධීකරණ අධිකාරියක් 2020 වර්ෂය වන විට ස්ථාපිත කර ඇත. මේ වන විට ක්‍රියාත්මක නොවේ	ප්‍රතිපත්තියේ ඇති ඉලක්ක නියමිත පරිදි සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

V.	කාර්යසාධන කාලරාමුවේ, බලශක්ති කාර්යක්ෂමතාවය සහ සංරක්ෂණය වැඩිදියුණු කිරීම යටතේ, පොදු ස්ථාන ආලෝකකරණය ද ඇතුළුව ග්‍රාමීය, නාගරික සහ ප්‍රධාන මාර්ග ආලෝකකරණය සඳහා ආලෝකකකරණ ප්‍රමිත 2020 වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් හඳුන්වාදී අනිවාර්ය පදනමින් ක්‍රියාවට නැංවීමට නියමිතව තිබුණද, අදාල ප්‍රමිත මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති බවට විගණනයට තොරතුරු ඉදිරිපත් නොකරන ලදී.	මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සකස් කර කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ පර්යේෂණ මට්ටමේ විදී ලාම්පු ආලෝකකරණය සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇති අතර එහි ප්‍රථිපල මත සෙසු පොදු ස්ථාන සඳහා මෙය හඳුන්වා දීමට නියමිතය.	ප්‍රතිපත්තියේ ඇති ඉලක්ක නියමිත පරිදි සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය.
VI.	බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගයන්හි පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහළ නැංවීම සඳහා 3.7.5 ඡේදය අනුව සුළං සහ සූර්ය බලශක්තිය වැනි විචල්‍ය පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් ජනනය කරන විදුලිය විදුලිබල පද්ධතියට අවශෝෂණය කිරීමේදී ඇතිවන තාක්ෂණික ගැටළු විසඳා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යානයන් සිදුකර නොතිබුණි.	පුනර්ජනනීය බලශක්ති ජාතික පද්ධතියට එක් කිරීම පිළිබඳ ගැටළු හා විසඳුම් හඳුනා ගැනීම සඳහා මහජන උපයෝගිතා කොමිසම විසින් යෝජනා අදහස් විමසිමින් සිටින අතර ඉදිරියේදී ඒ පිළිබඳ වාර්තාවක් ලබා දෙනු ඇත.	ප්‍රතිපත්තියේ ඇතුළත් අධ්‍යානයන් සිදුකර පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීමේදී ඇතිවන ගැටළු විසඳීමට කටයුතු කිරීම.